# حصن المسلم من الأمراض والأوبئة

# මුස්ලිම්වරයකුගේ රැකවරණය

باللغة السنهالية



إعداد

جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة

සියළුම රෝගපීඩාවන් සහ වසංගතයන් වලින්

# මුස්ලිම්වරයකුගේ රැකවරණය



# හදීස් අංක 1

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**
සෑම දිනකම උදේ හා සවස් වරුවේ කවරෙකු (බිස්මිල්ලා හිල්ලදී ලා යළුර්රු මඅ ඉස්මිහී ශෛයිඋන් ෆිල් අර්ළි වලා ෆිස් සමාඉ වහුවස් සමීඋල් අලීම්) යනුවෙන් තෙවරක් පවසන්නේද එදින කිසිදු හානියක් ඔහුට සිදු නොවේ.
(මූලාශ්‍රය: සහීහ් ඉබ්නු මාජාහ් 3134)

**තවත් වාර්තාවක:** මේ අයුරින් ඉහත සඳහන් ප්‍රාර්ථනාව කවරෙකු රාත්‍රියෙහි තුන් වරක් පවසන්නේ ද උදය වනතුරු අනතුරක් ඔහුට සිදු නොවේ. එසේම උදේ වරුවෙහි කවරෙකු තුන් වරක් මෙය පවසන්නේද සවස් වන තුරු අනතුරක් ඔහුට සිදු නොවේ.
(මූලාශ්‍රය: අබූ දාවූද් : 5088)

**තේරුම:** පොළොවෙ හි හෝ අහසෙ හි හෝ ඔහුගේ නාමය සමග කිසිම වස්තුවකට ගැටිය නොහැකි (අනතුරක් කළ නොහැකි) වූ අල්ලාහ්ගේ නාමයෙන් ආරක්ෂාව පතමි. ඔහු සියල්ල අසන්නාය. සියල්ල දන්නාය.





# හදීස් අංක 2

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

කවුරුන් උදය සහ සවස් වරුවේ (කුල් හුවල්ලාහු අහද් නමැති පරිච්ඡේදය හා මුඅව්විදතයින් නොහොත් කුල් අඌදු බිරබ්බිල් ෆලක් හා කුල් අඌදු බිරබ්බින් නාස් නමැති පරිච්ඡේද) තෙවරක් පාරායනා කරයි ද සියල්ලෙන් ආරක්ෂා වීමට ඒවා ප්‍රමාණවත්ය. (මූලාශ්‍රය: සහීහ් අල් ජාමි: 4406)



# හදීස් අංක 3

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**
කවරෙකු තම නිවසින් බැහැර යන විට (බිස්මිල්ලාහ්, තවක්කල්තු අලල්ලාහ්, ලා හවුල වලා කුව්වත ඉල්ලා බිල්ලාහ්) යනුවෙන් පවසයිද, ඔබට ප්‍රමාණවත් විය, ඔබට ආරක්ෂාව හිමි විය යැයි (සුර දූතයකු හරහා) කියනු ලැබේ. තවද ඔහුගෙන් ෂෙයිතාන් දුරස් ව යනු ඇත. (මූලාශ්‍රය: සහීහ් අල් ජාමි: 6419)

**තේරුම:** අල්ලාහ්ගේ නාමයෙන් පිටව යමි. ඔහු මත ම විශ්වාසය තැබුවෙමි. ඔහු හරහා මිස යම් හෙයකින් ආරක්ෂා වීමට ශක්තියක් හෝ හැකියාවක් හෝ නැත.



# හදීස් අංක 4

## (ක)හවුලා බින්ත් හකීම් (රළි) තුමිය විසින් නබි (සල්) තුමාණන් පැවසූ බව මෙසේ වාර්තා කරන ලදී:

කවරෙකු යම් ස්ථානයකට පැමිණ ඉනික්බිතිව (අඌදු බිකලිමාතිල්ලාහිත් තාම්මාති මින් ශර්රි මා (ක)හලක් යනුවෙන් පවසන්නේ ද එම ස්ථානයෙන් පිටව යන තෙක් ඔහුට කිසිදු හානියක් සිදු නොවී.
(මූලාශ්‍රය: සහීහ් මුස්ලිම් 2708)

**තේරුම:** අල්ලාහ්ගේ සම්පූර්ණ වූ වදන් තුළින් ඔහුගේ මැවීම් වලින් සිදු විය හැකි හානි වලින් මා ආරක්ෂාව පතමි.



# හදීස් අංක 5

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**
යම් රෝගයකින් හෝ ඌනතාවයකින් (පෙළෙන) පරික්ෂාවට ලක් වූ අයකු දුටු විට (අල් හම්දු ලිල්ලාහිල් ලදී ආෆානී මිම්මබ්තලාක බිහී වෆළ්ළලනී අලා කසීරින් මිම්මන් (ක)හලක තෆ්ළීලා) යනුවෙන් කවරෙකු පවසයි ද එම ඌනතාවය හෝ එම රෝගය ඔහුට නොවැළදේ.
(මූලාශ්‍රය: සහීහ් අල් ජාමි: 6248)

**තේරුම:** කුමකින් ඔබව පරීක්ෂණයට ලක් කළේද එයින් මාව බේරා, මට නිරෝගිකම ලබාදී, මවන ලද බොහෝ අයට වඩා වැදගත් අන්දමින් මාව ජීවත් කිරීමට සැලැස් වූ අල්ලාහ්ට සියලු ප්‍රසංශා හිමිවේවා.





# හදීස් අංක 6

**නබි (සල්) තුමාණන් මේ අයුරින් පවසමින් සිටි බව අනස් (රළි) තුමාණන් විසින් වාර්තා කරන ලදී:**

අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් බරසී වල් ජුනූනි වල් ජුදාමි වමින් සයියිඉල් අZස්කාම්.
(මූලාශ්‍රය: සහීහ් අල් ජාමි: 1281)

**තේරුම:** අහෝ අල්ලාහ්! ලාදුරු, උමතුබව, බරවා (වැනි රෝගවලින්) සහ වෙනත් නපුරු රෝග වලින් මම ඔබගෙන් රැකවරණය පතමි.



# හදීස් අංක 7

## අබ්දුල්ලාහ් බින් උමර් (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:

නබි (සල්) තුමාණන්ගේ ප්‍රාර්ථනාවන් අතුරින් මෙම වර්ගයේ ප්‍රාර්ථනාවද එකකි: අල්ලාහුම්ම ඉන්නී අඋඈදු බික මින් Z සවාලි නි:මතික, වතහව්වුලි ආෆියතික, වෆුජාඅත නිකමතික, වජමීඉ ස(ක)ඟතික.
(මූලාශ්‍රය: සහීහ් මුස්ලිම් 2739)

**තේරුම:** අහෝ අල්ලාහ්! නුඹ ලබා දුන් ආශීර්වාදයන් පහ වීමෙන්,  නුඹ ලබා දුන් නීරෝගීභාවය වෙනස් වීමෙන්, නුඹේ අනපේක්ෂිත දඬුවමින් හා නුඹේ සියලු වර්ගයේ කෝපවලින් මා ආරක්ෂාව පතමි.





# හදීස් අංක 8

**නබි (සල්) තුමාණන් පැවසූ බව අබූ හුරයිරා (රළි) තුමාණන් මෙසේ වාර්තා කරයි:**

අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් මුආෆාත ෆිද් දුන්යා වල් ආ(කි)හිරා යන ප්‍රාර්ථනාවට වඩා (අල්ලාහ්ගේ) දාසයකු ප්‍රාර්ථනා කරන විශිෂ්ඨ වෙනත් ප්‍රාර්ථනාවක් නොමැත.
(මූලාශ්‍රය: සහීහ් අල් ජාමි: 5703)

**තේරුම:** අහෝ අල්ලාහ්! මෙලොවෙහි හා පරලොවෙහි සුවය මා ඔබෙන් අසා සිටින්නෙමි.





# හදීස් අංක 9

දුන්නූන් නොහොත් යූනුස් (අලෙයිහිස් සලාම්) මත්සයාගේ කුස තුළ සිර වී සිටිනා විට අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කළ ප්‍රාර්ථනාව වන **(ලා ඉලාහ ඉල්ලා අන්ත සුබ්හානක ඉන්නී කුන්තු මිනල් ළාලිමීන්)** වනාහි යම් අපේක්ෂාවක් බලාපොරොත්තුවෙන් මෙම ප්‍රාර්ථනාව මගින් මුස්ලිම්වරයකු අයැද සිටියේ නම් සැබැවින්ම අල්ලාහ් ඔහුට ප්‍රතිචාර දක්වනු ඇත.
(මූලාශ්‍රය: සහීහ් අත් තර්ගීබ් 1644)

**තේරුම:** නුඹ හැර නැමදුමට සුදුස්සෙකු නොමැත. මා නුඹ සුවිශුද්ධ කරමි. සැබැවින් ම මා අපරාධකරුවන් අතුරිනි.

මෙම ප්‍රාර්ථනාව පිළිබඳ ඉබ්නුල් කයියිම් නැමැති විද්වතකු මෙසේ සඳහන් කරයි: ඒක දේව වාදය මගින් ලොවෙහි දුෂ්කරතාවන් පහ කරනු ලැබේ. දුෂ්කරතාවන් පහ කරන ප්‍රාර්ථනා ඒක දේව වාදය සමග බැඳී ඇත්තේ ඒ නිසාවෙනි. දුන්නූන් නොහොත් යූනුස් (අලෙයිහිස්සලාම්) තුමාණන්ගේ මෙම ප්‍රාර්ථනා පෙළද ඒක දේව වාදය සමග බැඳී ඇත. දුෂ්කරත්වයට භාජනය වූ යම් කෙනෙකු එමගින් ප්‍රාර්ථනා කළේ නම් ඔහුගේ දුෂ්කරතාව අල්ලාහ් පහ කරනු ඇත යන්න නිසැකය. (මූලාශ්‍රය:අල් ෆවාඉද් 66)



# හදීස් අංක 10

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

දැඩි පීඩාවෙන් ද දැඩි දුක්ඛිත තත්වයකට පත් වීමෙන් ද අයහපත් පෙර නියමයෙන් ද සතුරන්ගේ අපහාසයෙන් ද ආරක්ෂාව පතා ඔබ අල්ලාහ්ගෙන් ප්‍රාර්ථනා කරන්න.

(මූලාශ්‍රය: බුහාරි 6616)



# හදීස් අංක 11

**අබ්දුල් රහ්මාන් අබී බක්රා විසින් වාර්තා කරන හදීසයක ඔහු සිය පියාණන්ට මෙසේ පැවසූ බව වාර්තා වේ:**

පියාණෙනි! ඔබ සැමදා උදේ සහ හවස තුන් වරක් බැගින්(අල්ලාහ්ගෙන් පහත සඳහන් ආකාරයට) ප්‍රාර්ථනා කරනවා මම ශ්‍රවනය කරමි. එවිට ඔහු: පුතනුවණි! නබි (සල්) තුමාණන් මෙසේ පාරායනා කරන පුවත මම ඇසුවෙමි. එබැවින් මා එතුමාගේ ක්‍රියා කලාපය අනුගමනය කිරීමට ප්‍රිය කරමි යැයි පැවසුවේය. උදේ හා සවස් වරුවේ ඔබද එය තුන් වරක් කියමින් ප්‍රාර්ථනා කරන්න.

අල්ලාහුම්ම ආෆිනී ෆී බදනී, අල්ලාහුම්ම ආෆිනී ෆී සම්ඊ, අල්ලාහුම්ම ආෆිනි ෆී බසරී, ලා ඉලාහ ඉල්ලා අන්ත අල්ලාහුම්ම ඉන්නී අඌදු බික මිනල් කුෆ්රි වල් ෆක්රි වාඌදුබික මින් අදාබිල් කබ්රි ලා ඉලාහ ඉල්ලාහ් අන්ත.

**තේරුම:** යා අල්ලාහ්! මගේ ශරීරයට නිරෝගිභාවය ලබා දෙත්වා. යා අල්ලාහ්! මගේ කන් වලට නිරෝගිභාවය ලබා දෙත්වා. යා අල්ලාහ්! මගේ ඇස් වලට නිරෝගිභාවය ලබා දෙත්වා. නැමදුමට සුදුස්සා ඔබ හැර අන් කිසිවෙක් නැත. යා අල්ලාහ්! ඔබව ප්‍රතික්ෂේප කිරීමෙන් ද, දිළිඳු කමින්ද ආරක්ෂාව ඔබෙන් පතමි. කබ්රයේ (මිනී වළේ) වේදනාවෙන් ද මම ආරක්ෂාව ඔබෙන් පතමි. නැමදුමට සුදුස්සා ඔබ හැර අන් කිසිවෙක් නැත.(සහීහ් අබූ දාවුද්: 5090)



# හදීස් අංක 12

**නබි (සල්) තුමාණන් උදේ හවස මෙසේ ප්‍රාර්ථනා කළ බව අබ්දුල්ලා බින් උමර් (රළි) තුමා මෙසේ වාර්තා කරයි:**

අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් ආෆියත ෆිද් දුන්යා වල් ආ(කි)හිරා, අල්ලාහුම්ම ඉන්නී අස්අලුකල් අෆ්ව වල් ආෆියත ෆී දීනී වදුන්යාය වඅහ්ලී වමාලී. අල්ලාහුම්මස්තුර් අව්රාතී වආමින් රවුආතී අල්ලාහුම්මහ්ෆල්නී මින් බයිනි යදැයිය වමින් (ක)හල්ෆී වඅන් යමීනී, වඅන් ෂිමාලී වමින් ෆව්කී. අඋෘදු බිඅළමතික අන් උග්තාල මින් තහ්තී.

**තේරුම:** යා අල්ලාහ්! මොලොව හා පරලොව  නිරෝගීභාවය ඔබෙන් පතමි. යා අල්ලාහ්! මගේ ආගම, මගේ ලෞකික ජීවිතය, මගේ පවුල හා මගේ සැප සම්පත් වලට ඔබේ සමාව ද යහපත ද අයැද සිටිමි. යා අල්ලාහ්! මගේ අඩුපාඩු වසං කරනු මැනව.  මගේ බිය තුරන් කරනු මැන!  මගේ ඉදිරිපස, පසුපස,  දකුණු පස, වම්පස, ඉහළ හා පහළ යන පැතිකඩ වලින් ආරක්ෂාව සලසනු මැනව! මට පහළින් විය හැකි අනතුරු ඔබේ ශ්‍රේෂ්ඨත්වයෙන් මඟ හරවනු මැනව! (මූලාශ්‍රය: සහීහ් අල්කලිමුත් තයියිබ් 27)



# හදීස් අංක 13

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**
කෙනෙකු හිමිදිරි උදෑසන සුබ්හු සලාතය ඉටු කරන්නේද ඔහු අල්ලාහ්ගේ ආරක්ෂාව යටතේ සිටියි. (මූලාශ්‍රය: මුස්ලිම් 5/158)

# හදීස් අංක 14

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**
කෙනෙකු රාත්‍රි කාලයේදී (අල්කුර්ආනයේ – දෙවන පරිච්ඡේදයේ අවසාන වැකි දෙක පාරායනය කරන්නේ නම් ඒවා ඔහුට ප්‍රමාණවත්ය. (මුලාශ්‍රය : බුහාරි 5009, මුස්ලිම් 808)

**ඉමාම් නවවි තුමාණන් මෙසේ පවසයි:** ප්‍රමාණවත්ය යන්නෙන් එදින රාත්‍රි සලාතය වෙනුවෙන් නැතහොත් ෂෙයිතාන්ගේ ආරක්ෂාවට නැතහොත් සියළු කරදරවලින් ආරක්ෂාවට ඒවා ප්‍රමාණවත් වේ යනුවෙන් විවධ අදහස් විද්වතුන් පවසා ඇත. මේ කාරණා සියල්ලම මෙම වැකි මගින් අදහස් කෙරේ.





# හදීස් අංක 15

**අබූ හුරෛරා (රළි) තුමා මෙසේ පවසයි: ෂයිතාන් මා අමතා මෙසේ පැවැසුවේය:**

ඔබ නින්දට යන විට ආයත් කුර්සිය මුල සිට අල්ලාහු ලාඉලාහ ඉල්ලාහුව හයියුල් කයියූම් යනුවෙන් ආරම්භ කර අග දක්වා කියවන්න. මෙය පාරායනය කරමින් සිටිනා විට අල්ලාහ්ගේ ආරක්ෂාව ඔබට නොකඩවා ලැබෙයි. අලුයම කාලය දක්වා ෂයිතාන් ඔබට ළං වෙන්නේ නැත. මේ ගැන නබි (සල්) තුමාණන් මෙසේ පැවැසූහ: ෂයිතාන් අසත්‍යවාදියෙකුව සිටියද ඔබට සත්‍යම පවසා සිටියේය. (මූලාශ්‍රය: සහීහ් තර්ඝීබ් 610)





# හදීස් අංක 16

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

මෙතෙක් පහළ වූ පරීක්ෂාවන් ඉවත් කිරීමටත් මතුවට පහළ වීමට ඇති පරීක්ෂණයන් වළක්වා ගැනීමටත් (දුආ) ප්‍රාර්ථනාවන් තමන්ට පිහිට වෙයි. තවද සැබැවින්ම අල්ලාහ්ගේ පරීක්ෂණය ද පහළ වෙයි. (දුආ) ප්‍රාර්ථනාවන් හා එම පරීක්ෂණයන් එකට හමු වී අවසන් දින දක්වා පොරබදිමින් සිටියි. (මූලාශ්‍රය: සහීහ් අල්ජාමි: 7739)



# හදීස් අංක 17

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

නුඹලා රාත්‍රි කාලයේ සලාතයෙහි යෙදෙන්න. මන්ද එය නුඹලාට පෙර විසු යහපත් දනන්ගේ ක්‍රියා කලාපයයි. එය අල්ලාහ් වෙත සමීපතාවයක් ඇති කරයි. පාප ක්‍රියා වළක්වයි. වැරදි සඳහා සමාව ලබා දෙයි. රෝගාතුරුව සිටින්නාගේ රෝගය සුවපත් කරයි. (සහීහ් අල් ජාමි: 4079)





# හදීස් අංක 18

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

යහපත් ක්‍රියාවන් විනාශකාරී අනතුරු සහ නපුරු සිදුවීම් වළක්වන මාර්ගයයි. යහපත් අයවලුන් මෙලොවද එලොවද යහපත් අයවලුන් ම වෙති. (සහීහ් අල් ජාමි: 3795)

# හදීස් අංක 19

**නබි (සල්) තුමාණන් මෙසේ ප්‍රකාශ කළහ:**

මුළුතැන්ගෙය භාණ්ඩ වසා දමන්න. වතුර කලයෙහි කට බැඳ දමන්න. මන්ද වාර්ෂිකව එක් රාත්‍රියකදී වසන්ගතයක් පහළ වනු ඇත. වසා නැති භාණ්ඩ තුළට සහ බැඳ නැති භාණ්ඩයන් තුළ එම වසන්ගතය ඇතුල් වේ. (සහීහ් මුස්ලිම් 2014)



# හදීස් අංක 20

උමර් ඉබ්නු (ක)හත්තාබ් (රළි) තුමා මදීනා සිට ශාම් ප්‍රදේශයට ගමන් කළේය. සරග් යන ප්‍රදේශයට පැමිණි විට ශාම් ප්‍රදේශයේ වසංගත රෝගයක් පැතිරී යන බවට ආරංචි විය. එවිට එතුමා සමග සිටි අබ්දුල් රහ්මාන් ඉබ්නු අව්ෆ් (රළි) තුමා උමර් (රළි) තුමාට පහත සඳහන් නබි (සල්) තුමාණන්ගේ හදීසය මතක් කර දුන්නේය.

යම් ප්‍රදේශයක වසංගතයක් පැතිරී යන බව ආරංචි වූ විට නුඹලා ඒ නගරයට ඇතුල් නොවන්න. වසංගතය පවතින නගරයෙන් පිටත් වී තවත් නගරයකට ඇතුල් නොවන්න. පසුව උමර් තුමා සරග් ප්‍රදේශයේ සිට නැවත පැමිණියේය.

(සහීහ් බුහාරි 6973)





جمعية الدعوة والإرشاد وتوعية الجاليات بالربوة
هاتف:٠١١٤٤٥٤٩٠٠ - للتواصل :٠٥٦٩٣٧٤٩٨٦
OFFICERABWAH